මැදුලන වංශකතාව

SRI LANKA
The Guardian
WWW.SRILANKAGUARDIAN.ORG

FREE PUBLICATION

දේශපාලන විකෘතියේ අවසානයක ආරම්භය

නිලන්ත ඉලංගමුව

ජනාධිපති මහින්ද රාජපක්ෂ වසර දෙකකට කලින් ජනාධිපතිවරණයක් ප්‍රකාශ කිරීමෙන් කර ඇත්තේ තම කකුල කටේ දමාගැනීමය. දැන් ඇත්තේ එය ඔහුට හැපීමට ඉඩදී බලා සිටීම පමණි. ඔහුගේ ඇඳුම් ඔහු විසින්ම ගලවා ගනු ඇත. ඔහුගේ බලය ඔහු විසින්ම දියකර ගනු ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතියක පක්ෂය අතර පොදු එක තාවයක් ඇතිවීම අදහාගත නොහැකි මට්ටමේ දේශපාලන පෙරළියකි. මෙය අතිශය තීරණාත්මක සේම ඓතිහාසිකය. මෙහි පළමු පුරෝගාමීන් වූයේ ශ්‍රීපති සහ මංගලය. ඔවුහු ආණ්ඩුවෙන් පන්නා දැමූ විට, පසුව අසාර්ථක වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහජන පිළ හදා ගත්තේය. හැකි උපරිමයෙන් තම දේශාපාලනය රාජපක්ෂගේ විකෘති ආශාවන් වලට එරෙහිව දියත් කළේය. එකල පැවති දේශපාලන වාතාවරණය අනුව ඔවුන්ට වැඩි දුරක් යාමට සිදු නොවුනද දේශපාලනික වශයෙන් පළමු වැදගත් පියවරක් ලෙස එය හැඳින්වීමේ වරදක් නැත. චන්ද්‍රිකා මුල සිටම මොවුන්ට පණ දුන්නාය. ඒ තම පරම්පාරාව විසින් රැක දුන් දේශපාලනයේ ගරුත්වය රැකගැනීම සඳහාය.

ඉන් පසු රාජපක්ෂට එරෙහි විරෝධය ඓතිහාසික වශයෙන් අතට ගනු ලැබුවේ ජනරාල් සරත් ෆොන්සේකාය. ජනරාල් ෆොන්සේකා තම අර්ධ දේශපාලන අවබෝධය සම වුවද පැවති අභියෝගකාරී තත්වය හමුවේ දැඩි වෙනසක් ගෙන පරාජය කිරීමට නොහැකි යැයි සිතූ බලයක් සසල කිරීමට සමත් විය. රාජ-පක්ෂ අද්‍රාළ මැතිවරණයේ ප්‍රයෝජකයා වීම සඳහා ජනරාල් ෆොන්සේකා නොනිල වශයෙන් හිර කිරීමට පවා කටයුතු කරනු ලැබීය. එම බිහිසුණු සිද්ධිය සේම රාජපක්ෂලාගේ මිලිටරිය රටේ ජනතාවගේ අයිතිය මංකොල්ල කෑ ආකාරය දැඩිව අවබෝධයේ තබා ගැනීම අතිශය තීරණාත්මක වේ.

මිලිටරි සේවය වූ කලී උදාර සේවයකි. නමුත් එය දේශපාලන මෙවලමක් කොට මිලිටරියේ ආත්ම ගරුත්වය කෙළසා එය පටු දේශපාලන වුවමනාවන් වෙනුවෙන් අවභාවිතය කිරීම මහින් ඇතිකළ අවුල විසඳා ගැනීම සඳහා එහි සිටින සැබෑ වීරුවන්ගේ මෙහෙය අතිශය තීරණාත්මක වේ. මන්ද, පෙර මර්ධනයට වඩා වැඩි යමක් මෙවර සිදුවිය හැක්කේ මෙය රාජපක්ෂගේ අන්තිම බලාපොරොත්තුව වන හෙයිනි.

මෙවර මැතිවරණයේදී මිලිටරිය හා සම්බන්ධයෙන් විපක්ෂය සිදු කළ යුතු කටයුතු බොහොමයක් ඇති අතර එය දේශපාලනික වශයෙන් බුද්ධිමත්ව මෙහෙය වීම රට තුළ ව්‍යාකූල භාවයක් ඇතිවීම වැලැක්වීම සඳහා හේතු වේ. එසේම මෙම ක්ෂේත්‍රය අතිශය සංවේදී කාරණයකි. එය රාජපක්ෂලාගේ අන්තිම බිහිසුණු ගැලවුම්කාරකයද වීමට ඉඩ තිබේ. මෙය ඉතා පැහැදිලිව හඳුනා ගැනීම සහ එය ක්‍රමෝපායිකව හැසිරවීම තීරණාත්මකය.

රාජපක්ෂ මර්ධනය කළ යුතු යැයි මීළ ට රටේ පෘථුල වශයෙන් මතයක් ගොඩ නැගීමට සමත් වූයේ ණීහිටපු□ අගවිනිසුරු ඉලක්කකොට ගෙන කළ මර්ධනයයි. ඇය අතීතයට අයිති කාන්තාවක් නොව, වර්තමානය සතුකර ගත යුතු සහ අනාගතයට හිමි කාන්තාවකි. රාජපක්ෂ අධිකරණ පද්ධතිය තම හෙංචයියන් ලවා දූෂණය කරවීම මහින් රටට අත්වූ අපකීර්තිය ලෙහෙසි පහසු එකක් නොවේ. එහි මුල් කාලීන කොටස්කාරියක් වන ඇය, පසුකාලීනව ඉන් ගැලවීමට උත්සහ කොට ඇය විසින් ඇයව සොයා යෑම ආරම්භ කළ අවස්ථාවේදී රාජපක්ෂ තම අසීලාචාරභාවය පෙන්වනු ලැබීය. එය ම ින් ජාත්‍යන්තරව ඇති කළ අපකීර්තිය සුළුපටු කාරණයක් නොවීය.

රාජපක්ෂ මේ සෑම අවස්ථාවකදීම කෙසේ හෝ තම බලය රැක ගැනීමට සමත් විය. රටේ ව්‍යවස්ථා විකෘතිය, නිවැරදි කොට අපේ මාතෘභූමියේ ආත්මගරුත්වය ඇතිකරනු වෙනුවට හෙතම එය අවභාවිතයට ගනිමින් රට තවදුරටත් බේදවාචකය හමුවේ හාස්‍ය සොයායන ගොඩබිමක් බවට පත් කරනු ලැබීය. වැරදි දෙයක් නිවැරදි කිරීම වෙනුවට එම වැරැද්ද අවභාවිතයට ගෙන එමඟින් වඩාත් සංකීර්ණ විකෘතියක් නිර්මාණය කිරීම වූ කලී රාජපක්ෂගේ චින්තනයයි. එහි ඇති නීරස වන්නේ තමන්ගේ හොඳ සිහිනුවණින් බොරුවක් මෙන්ම වංචාවක් සිදු කොට එහි වරද අනුන්මත හෝ අතීතය මත පැටවීමය. ලංකාවේ සංස්කෘතික ගත ගැටලුවක් වන මෙය රාජපක්ෂලා තම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කිසිදු විලිලැජ්ජාවක් නොමැතිව භාවිතා කරනු ලැබීය.

දේශපාලඥයාගේ මූලික ක්‍රමෝපාය වූ කලී බොරුකීම සග මවා පෑමය. නමුත් බොහෝ දේශපාලඥයින් එක්තරා මට්ටමකට පැමිණි පසු තම ආත්මගරුත්වය පිළිබඳව ඇති බිය නිසා බොරු කීම මෙන්ම වංචා කිරීමට යම් කිසි විනයක් සහ සීමාවක් ලබා දෙන්නේය. එසේ කිරීමට නොහැකි වූ අයවලුන්ගේ අවසානය බේදාවාචකයක්ම විය.

රාජපක්ෂ වූ කලී එම දෙවන පාර්ශවයේ නියෝජනයකි. ඔහුට ඔහු මර්ධනය කරගැනීමට නොහැකි වී ඇති සැටියෙකි. ආශාව විසින් වර්තමානයේද වෛරය සහ තරහ විසින් තවත් දින කිහිපයකින් පසු එළඹෙන කාලයේදීද ඔහු පාලනය වනු ඇත. පෙරදා නොදුටු සැබෑ රාජපක්ෂ වීදී දිගේ සුසුම්හෙලනු ඇත. රාජපක්ෂ, රාජපක්ෂ විසින්ම ඇමීබාකරණයකට ලක්කර ගනුඇත. තමන් විසින් තමන් සපාකෑම බොහෝමයක් ආඥාදායකයින් ඔවුන්ගේ අවසාන භාගයට පැමිණි කළ ගොදුරු වූ රෝගයකි. ස්වභාවික නීතිය අනුව එය එසේ විය යුත්තේය.

තම ආශාව හමුවේ සීමාව හඳුන්වා දෙනු ලබන්නේ නීතිය මඟිනි. රටකට මෙන්ම තමන්ගේ පෞද්ගලික ජීවිතයට නීතියක් අවශ්‍ය වන්නේ මේ නිසාය. එය නැති තැන මිනිස් මනස තම සීමා රහිත තණ්හාව සංසිදුවා ගැනීම වෙනුවෙන් කළ හැකි සියල්ල කරනු ලබයි.

රාජපක්ෂ සිදුකළේ එයයි. ඔහු මේ වනවිට සිර වී සිටින්නේ නැවත හැරවිය නොහැකි තැනකය. සැබවින්ම තවත් වසර දෙකක් ඉවසාගත හැකිව තිබුණේ නම් තත්වය බොහෝ දුරට වෙනස් විය හැකිව තිබුණි. මෙහි බරපතළම දෛවෝපගත සිදුවීම් වලට මුහුණ දීමට සිදුවන්නේ රාජපක්ෂ පීතෘත්වය ලබාදුන් පරම්පාරවටය. ඔවුන්ගේ දේශපාලනය හාස්‍යක් මෙන්ම බේදවාචකයක් වනු ඇත්තේය.

රාජපක්ෂ ජනාධිපතිවරයා, තම අසීලාචාර දේශපාලනය රැකගැනීම සඳහා මුලාව මත පදනම් වූ දේශප්‍රේමීයත්වයට මුවාකොට කළ හැකි උපරිම උප්පර-වැට්ටි දැමුවේය. ඒ සඳහා ඔහු ජාත්‍යන්තර වශයෙන් කිසිදු රටක සිදු නොවන මට්ටමේ ආඥාන ගිවිසුම් වලට එළඹී තමන්ට ඒරෙහිව ඇති ජාත්‍යන්තර බලවේගය පාරාජය කිරීම සඳහා චීනය, රුසියාව වැනි රටවලට මෙරට නාස්ති කිරීමට අවශ්‍ය ඉඩ, නිල වශයෙන් ලබා දුන්නේය. රටට හානිකර සහ නොවැදගත් ව්‍යාපෘති රැසක් ඔහු තමන්ගේ මෙගා සංවර්ධනය හමුවේ හඳුන්වා දෙනු ලැබීය.

රාජපක්ෂගේ සැබෑ දේශපාලන හෙළිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහා ලේකම් වරයා විසින් ඉදිරි දින කිහිපය තුළදී හෙළිදරව් කරන විට. දේශපාලනයේ මවාපෑම ක්‍රමිකව සසල වී ජනරාල් සරත් ෆොන්සේකා අසමත් වූ කර්තව්‍ය වඩාත් සාර්ථකව ඉදිරියට ඇදෙනු ඇත.

මෙය විකෘති දේශපාලනයේ අවසානයක ආරම්භය යැයි නිසැක වශයෙන්ම කිව හැක්කේ ඒ නිසාය.

සෝභිත හිමි මෙන්ම අතුරලියේ රතන ස්වාමීන් වහන්සේලා මෙහි සැබෑ ධාවක බලවේගය වන බව කීමට කිසිවෙකු කුහක විය යුත්තේ නැත. විශේෂයෙන් අතුරලියේ රතන හිමි තම පළමු දේශපාලන රචනාව ක්‍රමිකව වඩාත් සිහිණුවනින් යුතුව ඇතැම් තීරණාත්මක සංශෝධන වලට ලක් කිරීම මෙහිදී පැසසිය යුතුය. මෙම එකමුතුව මහින් රටේ දෙමළ ජනතාවගේ සහ මුස්ලිම් ජනතාවගේ සහයෝගය ලබා ගැනීම වෙනුවෙන් ශක්තිමත් වැඩපිළිවෙලකට තල්ලූ වීමට අවශ්‍ය වන්නේ පියවර කිහිපයක් පමණි.

මෙම කාරනා හමුවේ, මෙම විකෘති දේශපාලනයේ කතුවරයා වන ජයවර්ධන තම ප්‍රතිසංස්කරණ මහින් ජනාධිපතිවරයාගේ ධූරකාලය වසර 12කට සීමා කරනු ලැබීමේ සැබෑ හේතුව තේරුම් ගැනීමට ජනාධිපති රාජපක්ෂ අපොහොසත් වීම රටේ වාසනාවකි. ඔහුට තම දේශපාලනයෙන් සමුගැනීමට සිදුවන්නේ රටටම අප්‍රසන්න වන චිත්ත රූපයයේද දුගඳේද උරුමක්කාරයා වශයෙනි.

මාගේ මාතෘභූමිය පිවිස සිටින්නේ තීරණාත්මක අවස්ථාවකටය. මෙය කළ හැකි කාරණයකි. අඥාදායකයා සහ ඔහුගේ වරිගය පුම්බාගෙන ඇති හුළං ඇරීම ටයරකයක හුළං යැවීමටත් වඩා පහසු කාරණයකි. අවශ්‍ය වන්නේ මුලාව තේරුම් ගැනීම සහ ඒය නැතිකර දැමීම වෙනුවෙන් තමන්ට කළ හැකි උපරිම දේ තම කුසලතාවය අනුව සිදු කිරීමේ සාමුහික වගකීම සියලූම දෙනා භාරගැනීමය. ඊට අවශ්‍ය වන්නේ දේශපාලන ඥානයය. එය විපක්ෂය වටා ඒකරාශී වෙමින් තිබේ. එවිට බොරුකාරයාට පැවැත්මක් නැති වනු ඇත.

මේ කාරණය සාක්ෂාත් කරගැනීම සඳහා වන අතිශය වැදගත් උපායමාර්ගය වන්නේ අහිංසාවාදී මානුෂික දේශපාලන මෙහෙයුමක් මහින් ගැටලූව විසඳා ගැනීම සහ ඒ වෙනුවෙන් සිදුකරන ප්‍රචාරණයේ කලාව සහ විනයයි.

මෙම කෙටි හැඳින්වීම සමහින් ජනාධිපති රාජපක්ෂගේ පරිපාලනය තුළ දේශපාලනික, සමාජීය සහ ආර්ථික වශයෙන් සිදු වූයේ කුමක්ද යන්න පහත කෙටි හැඳින්වීම් වලින් විස්තර කෙරේ. ඒ සඳහා තොරතුරු සම්පාදනය කරදුන් සියලූදෙනාට අපේ කෘතඥතාවය හිමි වේ.

රටටම වණයක් වූ පවුල් වනය

රාජපක්ෂ පරපුර

ආණ්ඩු කිරීමේ නාමයෙන් රටේ සිදුවෙමින් තිබෙන්නේ මහා වස්තු කොල්ලයකි. රාජපක්ෂ පවුල හා ඒ පවුලේ ගජමිතුරන් විසින් රටින් කොල්ලකා තිබෙන ධනස්බන්ධයේ ප්‍රමාණය අතිවිශාලය.

රටේ ජනයා එකතැන පල්වෙන තත්ත්වයක සිටියදී මෙම පවුල හා ගජමිතුරු කල්ලිය ප්‍රකෝටිපතියන් බවට පත්ව සිටිනවා. බලයට එන්නට පෙර මෙම පවුල ඉතාමත් සාමාන්‍ය පවුලක් ලෙස සැලකිය හැකි වුවත් දැන් ඒ පවුල ආසියාවේ සිටින ධනවත්ම පවුලක් බව සැලකිය හැකිය.

මේ පාලකයා ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදී කැරැල්ල පරාජය කළ බව ඇත්ත. ත්‍රස්තවාදී කැරලි ඇති වූවිට ඒවා පරාජය කිරීම රාජ්‍ය පාලකයා වෙත පැවරෙන වගකීමක්. මීට පෙරත් බලයේ සිටි විවිධ පාලකයන් ත්‍රස්තවාදී කැරලි පරාජය කොට තිබෙනවා. ඒත් ඒ කිසිදු රාජ්‍ය පාලකයෙක් කැරැල්ල පරාජය කිරීමේ නාමයෙන් රට අයිති කරගන්න උත්සාහ කර නැහැ. එහෙත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රභාකරන් පරාජය කිරීම වෙනුවෙන් රට තමන්ට අයිතියි කියන මානසිකත්වයකිනුයි කටයුතු කරමින් සිටින්නේ.

මතුපිටින් බලනවිට යටිතල පහසුකම්වල ලොකු සංවර්ධනයක් ඇතිවී තිබෙන බව පේනවා. ඒත් ඒ සංවර්ධනය යට තිබෙන්නේ දැවැන්ත වස්තු කොල්ලයකි. චීනයෙන් ලබාගන්නා ණය ජාත්‍යන්තර ප්‍රමිති අනුව ලොකු පොලියක් සමග අපි ආපසු ගෙවිය යුතුයි. චීන ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ ටෙන්ඩර් නැතිව. රුපියල් 100 කට කළහැකි වැඩක් සිදු කෙරෙන්නේ රුපියල් 1000 කට විතර. ඒ මගින් සිදුවී තිබෙන ගසාකෑම අතිවිශාලයි. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය වශයෙන් අපට ලැබී තිබෙන්නේ නව තාක්ෂණය සහ අලුත් යන්ත්‍ර සූත්‍ර සහිත බලාගාරයක් නෙවෙයි. යල්පැන ගිය පරණ බලාගාරයක්. ඒත් ඒ වෙනුවෙන් අප ගෙවා තිබෙන්නේ අලුත් බලාගාරයකට ගෙවන මිල.

හම්බන්තොට ලොකු වරායක් ඉදිකර ඇතත් ඒකට නැව් එන්නේ කලාතුරකින්. මත්තල ලොකු ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ඉදිකර ඇතත් ඒකට ගුවන් යානා එන්නෙත් කලාතුරකින්. නිබුණු ජාත්‍යන්තර ක්‍රිකට් පිට්ටනිවලට අතිරේකව අලුත් ජාත්‍යන්තර ක්‍රිකට් පිට්ටනි ඉදිරකර ඇතත් ඒවායේ ජාත්‍යන්තර ක්‍රිකට් තරග පැවැත්වෙන්නෙත් ඉතාම කලාතුරකින්.

මෙම සංවර්ධන ව්‍යාපෘති සඳහා වැයකර තිබෙන ධනස්කන්ධනය හිතුවක්කාරී ලෙස වැය කරනවා වෙනුවට ඵලදායී හා දැහිතකාමී ලෙස ප්‍රයෝජනයට ගත්තේ නම් රටේ යටිතල පහසුකම් නවීන කරනවාට අතිරේකව රටේ දුප්පත්කම මුළුමනින්ම නැති කිරීමට හා රටේ ගොවි කම්කරුවන්ගේ අතමිට සරුවීමට හේතුවන ලෙස කාර්මික හා කෘෂිකාර්මික ව්‍යාපාර රැසක් ඇතිකොට රට සමෘද්ධිමත් රටක් බවට පත් කරන්නට පුළුවන්කමක් තිබුණා.
දැන් මුළු රටම තියෙන්නේ අවලස්සන තත්ත්වයක. හීනිය වල්වැදිලා. සාරධර්ම පිරිහිලා. රට කුඩුකාරයන්, එතනෝල්කාරයන් හා අපරාධකාරයන් රජකරන අවලස්සන රටක් බවට පත්වෙලා.

රට ඇදදමා තිබෙන අවලස්සන හා අශීලාචාර තත්ත්වයෙන් රට මුදාගැනීම සඳහා මෙම ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂගේ අශීලාචාර පවුල් පාලනය පරාජය කිරීම අත්‍යවශ්‍යයි. පරාජයක් ඇතිවීම වලකා ගැනීම සඳහා කෙළවරක් නැති තරමටම ධනය විසිකරන තත්ත්වයකුයි දැන් ඇති වී තිබෙන්නේ. අයථා ලෙස උපයා ගෙන තිබෙන වස්තුවේ ප්‍රමාණය කොතරම් විශාලද කියා එයින්ම තේරුම් ගන්න පුලුවන්. මෙම ජනාධිපතිවරණයේදී මෙම දූෂිත පාලකයා පරාජය කිරීම සඳහා උපරිම වශයෙන් ක්‍රියා කරන්න.

රාජපක්ෂ පරපුර ගැන මීට අවුරුදු සියයකට පෙර හම්බන්තොට දිසාපතිව සිටි ලෙනාඩ් වුල්ෆ් මහතා තරම් හොඳින් දැන සිටියෙක් නැති තරම්ය. ඔහු වරක් කීවේ මේ පරම්පරාවට නම් බෙලිඅත්තේ දේශපාලන බලය ලබා නොදිය යුතු බවය. එහෙම වුනොත් හම්බන්තොට දිස්ත්‍රික්කයම සූරාගෙන කාලා විනාශ කරන බව ඔහු ලියා තැබිය. ඒ රාජපක්ෂලා දේශපාලනයට එන්නත් කලින් ය.

මේ රාජපක්ෂලා රටම හුරගෙන කන යුගයයි. මේ මහින්ද රාජපක්ෂ යනු රාජපක්ෂ පවුලේ තුන්වැනි පරම්පරාවය. රාජපක්ෂ පවුල අද රටම සූරගෙන කන විත්තිය ගැන තවත් අටුවා ටීකා ටිප්පනි ලියා තබා පැහැදිලි කර ගත යුතු තරම් ලොකු කතාවක් නොවේ. ඒ රාජපක්ෂ පවුල මේ රට වෙලාගෙන තිබෙන අන්දම අනුව එය ඉතා පැහැදිලිය.

මහින්ද රාජපක්ෂ දේශපාලනයටෙ එන්නේ ඊට සුදුසුකමක් හෝ උගත්කමක් ඇතිව නොවේ. පසුගියදා මහින්ද රාජපක්ෂ කීවේ රාජපක්ෂ සහෝදර සමගම හැදුවේ මං නොව සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය විසින් බවය. ඒ කතාවේ ඇත්තේ අර්ධ සත්‍යකි.

ඩී. ඒ. රාජපක්ෂ මහතා මියපරලොව යෑමෙන් පසුව බෙලිඅත්තේ ශ්‍රී ලනීප දේශපාලනය කිරීමට කිසිවකු නැති තැන සිරිමාවෝ කළේ එවකට පොලීසියේ සුළු නිළධාරියකු ලෙස රස්සාව කරගෙන සිටි ඩී. ඒ ගේ ලොකුපුතා හා වැඩි උගත්කමක් තිබූ චමල් රාජපක්ෂට බෙලිඅත්ත බාරගෙන දේශපාලනයට පිවිසෙන ලෙස ආරාධන කිරීමය.

එහෙත් ඒ යෝජනාව චමල් ඉවත දැම්මේ දේශපාලනය නිසා කරගෙන හිටපු රස්සාවත් නැතිවෙයි කියන බයටය. එහෙත් බෙලිඅත්තේ තිබුණු තමන්ගේ පවුල් බලය ගිලිහෙනු ඇතැයි සිතූ දන්දිනා දිසානායක මහත්මිය (මව) ඒ සඳහා මහින්දව යෝජනා කළේය. එවකට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල පුස්තකාලයේ සේවකයකු ලෙස ඔහු රැකියාවක් කරමින් සිටියේය. මෙම රැකියාවත් ඔහුට ලැබෙන්නේ බෙලිඅත්තේ ඔහුගේ නිවස ඉදිරිපිට විසූ එම විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයකු මාර්ගයෙනි.

කෙසේ නමුත් මේ යෝජනාවට සිරිමාවෝ අකමැති වූ නමුත් රාජපක්ෂ පවුල එජාපයට වැඩ කරන බවට කළ බලපෑම නිසා ඊට සිරිමාවෝ කැමැති විය. 1970 මහ මැතිවරණයෙන් මහින්ද පාර්ලිමේන්තු එන්නේ එලෙසය. සහෝදර සමාගමේ ඉතුරු හරිය **ගොඩනැගෙන්නේ ඉන් පසුවය.**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නීති විභාගයට පෙනී සිටීමට හැකි බවට සටකපට පනතක් ගෙන එමින් මහින්ද රාජපක්ෂය නීති විද්‍යාලයට ඇතුළු වීමට අවස්ථාව උදාකර ගත් අතර පසුව එම පනත අහෝසි කරනු ලැබීය. නීතිඥයෙකු ලෙස කටයුතු කළත් ඉන් ආදායමක් ලබන්නට තරම් ඔහු ඊට දක්ෂයකු නොවිණි. එකල මහජන නියෝජිතයන්ට අයථා ලෙස මුදල් උපයන්නට අවස්ථා විරල වූ අතර මන්ත්‍රීවරුන්ට ඉහළ පඩි නඩි ලැබුණේද නැත. මේ නිසා ඔහුගේ බිරිඳ ශිරන්ති වික්‍රමසිංහ පවුලේ ආර්ථිකය වෙනුවෙන් පෙර පාසලක්ද පවත්වගෙන ගියාය.

එහෙම පටන් ගත් මේ මහින්ද රාජපක්ෂ පවුල් පාලනයේ අනෙක් කතා මෙසේය.

මහින්ද රාජපක්ෂ

(උපත 1945) ජනාධිපති (2005-) ආරක්ෂක අමාත්‍යවරයා (2005-) මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යවරයා (2005-) මහාමාර්ග අමාත්‍ය (2010) වරාය සහ ගුවන්සේවා අමාත්‍ය (2010) වරාය සහ මහාමාර්ග අමාත්‍ය (2010-) නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍ය (2013-) අග්‍රාමාත්‍යවරයා (2004-05) විපක්ෂ නායක (2002-04) විපක්ෂයේ ප්‍රධාන සංවිධායක (2001-02) වරාය අමාත්‍ය (2000-01) ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය (1997-01) කම්කරු සහ වෘත්තිමය පුහුණු අමාත්‍ය (1994-97) හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී (1989-2005) බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී (1970-77) බිරිඳ ශිරන්ති රාජපක්ෂ (විවාහයට පෙර වික්‍රමසිංහ)

සුනාමි සහනාධාර (හෙල්පින් හම්බන්තොට) මිලියන 83ක් වංචා කිරීමේ සිට චීන ගනුදෙනු හරහා 2012 වසර වන විට කෝටි 24.000ක් උපයා ගත් බවට රාජපක්ෂ සහෝදරයන්ට චෝදනා එල්ලවී ඇත. ජනාධිපතිවරයාගේ වියදම් ලෙස (2015 අයවැයෙන් කෝටි 959කි) වෙන්කරගත් මුදල අනුව දිනකට ලක්ෂ 262 ක් හේ වියදම් කරයි. අරලිය ගහ මැදුරේ දිනක පළතුරු වියදම රු ලක්ෂ 5 කි. ඒත් රටේ ජනගහනයෙන් සියයට 41 කගේ දවසේ ආදායම රු. 260 ට අඩු බව රජයේ සංඛ්‍යා ලේඛනවල සඳහන්ය.

රටේ සමස්ත අයවැයෙන් අඩක්ම මහින්ද යටතේ වෙයි. රාජපක්ෂ පවුල යටතේ සමස්ත අයවැයෙන් සියයට 69.9ක් පාලනය වෙයි. සිය කාර්ය මණ්ඩලය සමග ඔහු වාහන 2000 කට ආසන්න ප්‍රමාණයක් පාවිච්චි කරයි. ජනාධිපති උපදේශකවරු 193 කි. හිටපු ජනාධිපතිවරුන්ට හිටියේ 5 දෙනෙක් පමණි. මේ 193 න් 120 ක්ම පමණම රාජපක්ෂ පවුලේ ඥාතීන්ය.

නාමල් රාජපක්ෂ (උපත 1986) හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී (2010-) තරුණ්‍යයට හෙටක් සහාපති ඔහුගේ පාවිච්චිය සඳහා වාහන 22ක් පවතී. වංචාකාරී ලෙස නීතිවිභාගය සමත්වීමටත් ජපුර විශ්ව විද්‍යාලයෙන් සුදුසුකම් කිසිවක් නොමැතිව ආචාර්ය උපාධියක් ලබා ගැනීමටද හේ සමත්ව සිටින් බවටත් චෝදනා එල්ලවී තිබේ. ජනාධිපතිවරයාගේ විධායක බලතල ආරෝපනය කරගෙන ඇමැති මණ්ඩලය පවා පාලනය කිරීමට මොහු කටයුතු කර තිබේ. එමෙන්ම රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය හා තරුණ කටයුතු දේශපාලනීකරණය කිරීමටත් වලපල්ලට ඇද දැමීම ගැනත් වගකිව යුත්තෙකි. නිළියන් ඇසුර ප්‍රියකරන්නෙකි.

යෝෂිත රාජපක්ෂ

කාල්ටන් ස්පෝට්ස් නෙට්වර්ක් අයිතිකරු, නිල නොලත් නාවික හමුදාපති, ඇස්ටන් මාර්ටින් වර්ගයේ සුපිරි රේසින් මෝටර් රථයක් ඇතුළුව රේසින් මෝටර් රථ 6ක් සහ ඔහුගේ පාවිච්චිය සඳහා වාහන 20ක් පවතී. ඔහුගේ පෙම්වතිය වූ යසාරා අබේනායක මේ වන විට ඕස්ට්‍රේලියාවේ මහකොමසාරිස් කාර්යාලයේ ඉහළ තනතුරකට පත් කොට ඇත.

පෙම්වතියගේ කලින් පෙම්වතා වූ රගර් ක්‍රීඩකයෙකුගේ ඝාතනයක් සම්බන්ධයෙන් ද යෝෂිතගේ නම ඇදී ඇත.

චයිනා ස්පේස් ප්‍රාථමික ගගනගාමී අධ්‍යාපනය අවසන් කිරීමෙ
රෝහිත රාජපක්ෂ මහතා අදාළ සහතිකය ඉකුන්දා ලබාගත
ගාව.

රෝහිත රාජපක්ෂ

රෝහිත රාජපක්ෂ පාවිච්චි කරන සපත්තු දෙක රුපියල් 1.50.000 ක් බව ඔහුම මාධ්‍යට පවසා ඇත. ඇස්ටන් මාර්ටින් ලැම්බෝගින් වැනි සුපිරි රේසින් මෝටර් රථ 19ක් හිමි බව කියයි. එහි වටිනාකම කෝටි 90ක් පමණවේ. ගගනගාමියකු වන්නට රුසියාවේ හා චීනයේ ඉගෙනුම ලැබීමට ඔහු පොට පාදා ගනී.

මේ රාජපක්ෂ පුතුන් වෙනුවෙන් එංගලන්තයේ රැජිනගේ මාළිගාවේ සුදු අශ්වයෙක් කෝටි ගණනක මුදලකට ගෙනා ආ බව ද දැන් හෙළි වී තිබේ. මේ අශ්වයා දැනට නුවරඑළියේ ජනාධිපති මන්දිරයේ සිටී.



ගෝඨාභය රාජපක්ෂ

ආරක්ෂක ලේකම්, ලංකා හොස්පිටල් ඇතුළු රාජ්‍ය සමාගම් කිහිපයක අධිපති, යුදහමුදාවේ කර්නල් වර්යකුව සිටියදී (1992) හමුදාව අත්හැර විදෙශ් ගත විය. 88-89 යුගයේදී මාතලේ වදකා ගාරයක් බාරව කටයුතු කළ අතර එහිදී සියග නනක් ජවිපෙ සාමාජිකයන්ට දස වදී දී මරා දැමුණේය.



උතුරේ යුද්ධයේදී යටත් වූ සටන්කාමීන් මරා දැමීම ඇතුළු සිවිල් වැසියන් මරා දැමීම සම්බන්ධයෙන් බරපතල යුධ අපරාධ චෝදනා එල්ල වෙමින් තිබේ. ආරක්ෂක ලේකම් වරයා ලෙස රට තුල මිලිටරි පාලනයක් ගෙන යන අතර විරුද්ධවාදීන් මර්දනය පිණිස කටයුතු කරයි. නිල හා නොනිල මැර හමුදා පවත්වාගෙන යයි. පුද්ගල පැහැරගෙන යාම් හා අතුරුදහන් කිරීම් රැසක් ඔහුගේ අනු දැනුම යටතේ සිදුව තිබේ.

රුසියාවෙන් පැරණි මිග් යානා මිළදී ගැනීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇත. වසර 2000දී මිග් 27 යානයක මිළ රුපියල් 160ක් තිබියදී ඒ

මිලියන 240 කට මිල දී ගත් බවට ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර තිබිණි. කොළඹ ඉඩම කොල්ලය කප්පම් ගැනීම් ගැන චෝදනා එල්ල වී ඇති වරක් සුරිවි නුවර සිට බලු පැටියකු ගෙන ඒම සඳහා ශ්‍රී ලන්කන් එයාර් ගුවන් යානයක සිටි මඟීන් බස්සවා එම ගුවන් යානය යෝදාගෙන තිබිණි.

මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය, ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම හා තවත් මාධ්‍යවේදීන් රැසකට ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධ චෝදන එල්ල වී ඇත. ආගමික ත්‍රස්ත කල්ලියක් වන බොදු බල සේනා සංවිධානය මෙහෙයවමින් අලුත්ගමදී මුස්ලිම් ප්‍රජාවට පහරදී තිදෙනෙකු මරා දැමීම හා රට පුරා මුස්ලිම් දේපල වලට හානි කිරීම මොහුගේ අනු දැනුම යටතේ සිදු විය. ඇමරිකානු පුරවැසිභාවය මොහුට ඇති අතර අමරිකාවේ දේපල හිමියෙකි.

ගෝඨාභය රාජපක්ෂ ලේකම්වරයාගේ බිරිඳ වන අයෝමා රාජපක්ෂ නමින් වන නිවාස 02ක තොරතුරුද අනාවරණය වේ. 1341 Wickham Ct, San Dimas, CA 91773 ,303 S Cataract Ave, San Dimas, CA 91773 යන ස්ථානවල එම නිවෙස් පිහිටා ඇත. 2007 අයෝමා රාජපක්ෂ නමින් San Dimas හි තිබූ පැරණි නිවසේ වටිනාකම ඩොලර් 9.95.000ක් විය.



බැසිල් රාජපක්ෂ

ආර්ථික සංවර්ධන ඇමැති සටකපට කුමන්ත්‍රණකාරී පුද්ගලයෙකි.

රටේ සියලු සංවර්ධන ක්‍රියාදාමයක්ම මොහු යටතේ වන අතර එම සෑම ව්‍යාපෘතියකින්ම සියයට 10 සිට 200 දක්වා කොමිස් මුදලක් මොහු ලබා ගනී. විදේශීය ආයෝජකයන් ගෙන් වැඩි කොමිස් මිදල් ලබා ගන්නා අතර ඒ වෙනුවෙන් නියමිත මිළ ගනන්වලට වඩා වැඩි ගෙවීම් එම සමගම්වලට ගෙවනු ලබයි.

චීන සමාගම් හා බොහෝ ගනුදෙනු ප්‍රමාණයක් සිදු කරනු ලබන්නේ මොහු විසින්ය. ලෝප්‍රකට ගූගල් සමාගම මෙරට ආයෝජනය කිරීම සඳහා පැමිණියද සියයට 15ක කොමිස් මුදලක් ඉල්ලීම නිසා එම සමාගම මෙරට අත හැරියේය. එමෙන්ම බැසිල් රාජපක්ෂට අයත් විශාල ව්‍යාපාර ප්‍රමාණයක් මෙරට හා විදේශයන් හී ක්‍රියාත්මක වන අතර මේවා විවිධ නාමයන් හා විවිධ අප්‍රකට පුද්ගලයන්ගේ නමින් පවත්වාගෙන යනු ලබන බව හෙලි වී ඇත.

බැසිල් රාජපක්ෂගේ බිරිඳ වන පුෂ්පා රාජපක්ෂ නමින් කැලිෆෝනියාවේ පිහිටි නිවාස 04ක් ඇතුළත්ය. ඒවායේ ලිපිනයන් පහත පරිදිය. (1) 5581 Homecoming, Mira Loma, CA 91752 (2) 15067 Preston Dr, Fontana, CA 92336 (3) 222 Dexter St, Covina, CA 91723 (4) 15067 Preston Dr, Fontana, CA 92336 යන ස්ථානවල එම නිවාස ඇත.

http://radaris.com/ නම් වක්සත් ජනපදයේ පුද්ගල සෙවුම් වෙබ් බවුසරයේ අදාළ නම් ඇතුළත් කිරීම මගින් එම ස්ථාන ඕනෑම අයෙකුට පරීක්ෂා කර ගත හැකිය.

මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාන්තා කටයුතු සියල්ල පුෂ්පා රාජපක්ෂ අතට පත්ව ඇත.

බැසිල් රාජපක්ෂට දියණියන් දෙදෙනෙක් හා පුතකු වෙයි. මොවුන් තිදෙනාම අමෙරිකාවේ අධ්‍යාපනය ලබා ඇමෙරිකාවේම ජීවත්වේ. දියණියන් දෙදෙනා විවාහ වී සිටින්නේ විදේශිකයන් සමඟය.

බට්ටිලාගේ නිදහස...

බැසිල්ගේ බාල දුව බිමල්කාගේ නිදහස...

චමල් රාජපක්ෂ

චමල් රාජපක්ෂ (උපත 1942) පාර්ලිමේන්තුවේ කථානායක (2010-) වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍ය (2007-2010) වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය (2004-07) වරාය සංවර්ධන සහ දක්ෂිණ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය (2000-01) හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී (1989-) බිරිඳ චන්ද්‍රා මාලිනී විජේවර්ධන

ශෂීන්ද්‍ර - ශමීන්ද්‍ර

ශෂීන්ද්‍ර රාජපක්ෂ ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා (2009-) මොණරාගල දිස්ත්‍රික්කය සඳහා ඌව පළාත් සභා මන්ත්‍රී (2009-) රුහුණු මහා කතරගම දේවාලයේ බස්නායක නිලමේ ජනාධිපතිවරයාගේ පුද්ගලික ලේකම්. ශෂීන්ද්‍ර කතරගම දේවාලයේ සම්පූර්ණ පාලනය තමන් යටතට ගැනීම සඳහා විශාල උත්සහයක් ගනිමින් තිබෙන අතර ඒ වෙනුවෙන් එම දේවාලයේ වතාවත් හාර කපු මහතකු සමඟ ගැටුමක් ඇති කරගෙන තිබේ. අධිකරණයෙන් එම කපු මහතාට දේවාලයේ කටයුතු කිරීමේ අයිතිය ලබාදී තිබුණද ඊට ඉඩක් ශෂීන්ද්‍රගෙන් ලැබී තැත. මැරයන් ලවා පහරදීමද වාර්තා විය. ශෂීන්ද්‍රගේ බිරිඳ ලෙක්ෂිකා හොර එතනෝල් මිශ්‍ර මත්පැන් නිෂ්පාදනය කරන ලක්ෂමන් වසන්ත පෙරේරා මන්ත්‍රීගේ සමාගමේ කොටස්කාරියකි.

ශමීන්ද්‍ර රාජපක්ෂ ශ්‍රීලංකන් එයාර් ලයින්ස් හී අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා ටෙලිකොම්හී අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂක, මුදල් හා සැලසුම් අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්. ඔහු මේ තනතුරුවලට පත් වූයේ කිසිදු අධ්‍යාපන සුදුසුකමක් අනුව හෝ වෘත්තීය පළ පුරුද්දක් අනුව හෝ නොවේ. එමෙන්ම ඉතා ලාබාල වයසේදීය.

චන්ද්‍ර ට්‍රයුඩර් රාජපක්ෂ

චන්ද්‍රා ට්‍රයුඩර් රාජපක්ෂ මුදල ඇමැති (මහින්දගේ)ගේ පෞද්ගලික ලේකම්
ට්‍රයුඩර්ගේ පුතා චමින්ද රාජපක්ෂ ජනාධිපති උපදේශක හම්බන්තොට සම්බන්ධීකරන ලේකම්.

CEO, SLT, Creg Young with other officials at the launch..
Pic:Ruwan de Silva.



ජයන්තිගේ පුතා හිමාල් ලලීන්ද්‍ර හෙට්ටිආරච්චි ස්කයි නෙට්වර්ක්ස්හී ප්‍රධානි, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට වයිමැක්ස් තාක්ෂණය හඳුන්වා දීමේ කොන්ත්‍රාත්තුව ලබාගෙන රුපියල් මිලියන සියයක පමණ අක්‍රමිකතාවක් සිදු කළ බවට චෝදනාවක් ඉදිරිපත් විය. ඔහුගේ සමාගම මේ හොර ගනුදෙනුව වෙනුවෙන්ම හදිස්සියේ පිහිටුවා ගත් සමාගමක් වූ අතර මේ දූෂිත ගණුදෙනුව හෙළිවීමෙන් පසුව ඒ සූක්ෂම ලෙස යටපත් කෙරිනි මෙවැනි තවත් ගනු දෙනු රැසකට මෙම පුද්ගලයා හවුල් වී සිටී.

රංගනී හෙට්ටිආරච්චි නම් සහෝදරියක්ද ඔහුට සිටී. ඇය ව්‍යාපාර කිහිපයක් සිදුකරයි.



ප්‍රීති රාජපක්ෂ

ප්‍රීති රාජපක්ෂ මහින්ද රාජපක්ෂගේ තවත් සහොදරියකි. ඇගේ සැමියා ලලිත් ප්‍රියලාල් චන්ද්‍රදාස

චන්ද්‍රදාස ලංකාවේ ප්‍රධාන නියාමන ආයතන ගණනාවක ඉහල නිළතල හොබවයි. විශේෂයෙන්ම ආර්ථික ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතන වන විනිමය සුරුකුම් හා කොටස් හුවමාරු මධ්‍යස්ථානය, වරාය අධිකාරිය, රක්ෂණ සංස්ථාව, ඩී.එෆ්.සී.සී. බැංකුව, ජලජ සම්පත් සංවර්ධන අධිකාරිය ආදී ආයතන ගණනාවක සභාපති, අධ්‍යක්ෂ ආදී තනතුරු හොබවයි. ඔහු මඟින් මේ ආයතන සියල්ලේ පාලනය නිල නොවන ආකාරයට මහින්ද රාජපක්ෂ අත තබාගෙන තිබේ. දරුවන් සිව් දෙනෙකි.

මාලක, මාධව, මාධනී (ගුවන් නියමු), මලිකා

ගාන්දිනී රාජපක්ෂ

මහින්දගේ බාල සහෝදරිය චන්ද්‍රාණී (ගාන්දිනී) රාජපක්ෂ ඇගේ සැමියා තුසිත රන්සි රණවක තේ දළු කර්මාන්තයට සම්බන්ධ අතර ව්‍යාපාරිකයෙකි. රාජ්‍ය සමාගමක් වූ මඟ නැගුම ආයතනයේ මුදල් වලින් නිවසක් (දෙනියාය මාලිගය) චෝදනා එල්ලවිය. වන අලි ජාවාරමටද සම්බන්ධ බවට තොරතුරු හෙළිව තිබේ.



මෙම අලි පැටවා රැගෙන ගොස් ඇත්තේ, වනජීවී දෙපාර්තමේන්තුවට අයත් ලොරියකිනි.

මෙම අලි පැටවා පින්නවල අලි අනාථාගාරයේ ඩිටි නන්දිමිත්‍ර නම් අලි පැටවා ජනාධිපති ලක්ෂණවලින් යුතු අලි පැටවා ලෙස සැලකේ.

ජයන්ත වික්‍රමසිංහ, තුසිත රන්සි රණවක ගේ මස්සිනා (ජයන්ත විවාහවී සිටින්නේ තුසිතගේ සහෝදරියක සමඟය) ලංකා ලොජිස්ටික් සමාගමේ පරිපාලන ප්‍රධානී. ආරක්ෂක අංශ සඳහා අවි ආයුධ ගෙන්වන්නේ මෙම සමාගමෙනි. මෙහි ප්‍රධානියා ආරක්ෂක ලේකම්වරයාවේ. ලංකා ලොජිස්ටික ආයතනය හරහා දූෂිත අවිගනුදෙනු රැසක් සිදුවූ අතර දූෂිත මිග් 27 ගනුදෙනුවද සිදුවූයේ මෙමඟිනි. ජයන්ත වික්‍රමසිංහ ගෝඨාභයගේ පාසල් මිතුරාද වේ. නාගරික සංවර්ධන අධිකාරියේ කලමණාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකි.

ජයන්තගේ සහෝදරයා ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ ලංකා බැංකුවේ සභාපතිව සිටි අතර පසුව නාමල් රාජපක්ෂ සමඟ වූ පවුල් ආරවුල මත ඉන් ඉවත්විය. ලංකා හොස්පිට්ල්ස් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ශ්‍රී ලංකාවේ විශාලතම පරිගණක මෘදුකාංග සැකසීමේ ආයතනයක් වන ඉන්ෆොමැටික්ස් ග්‍රෘප් ඔෆ් කම්පනීස් ආරම්භ කළ අතර එහි සභාපතිත්වය ද දරයි.

මේ සහෝදරයන්ගේ අනෙක් සහෝදරයා ප්‍රවීණ ගෘහනිර්මාණ ශිල්පී සුරත් වික්‍රමසිංහය.

නිරූපමා රාජපක්ෂ

මහින්ද රාජපක්ෂගේ පියාගේ සහෝදරයා වන ඩී. එම්. රාජපක්ෂ මහතාගෙන් පැවැතෙන තෙවන හා සිව්වන පරම්පරාවන්ද මෙකල මහින්ද රාජපක්ෂගේ පවුල් ආධිපත්‍ය පැතිරවීමට හවුල් වී සිටී. ඩී.එම්. ගේ පුතකු වන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝර්ජ් රාජපක්ෂ මහතාගේ ගේ දුවෙකි. වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීනී නිරූපමා රාජපක්ෂ මහින්ද ඇගේ බාප්පාය.

නිරූපමා රාජපක්ෂ (උපත 1962) ජල සම්පාදන සහ ජලාපවාහන නියෝජ්‍ය අමාත්‍ය (2010-) හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී (1994-2000 - 2005-) ඇගේ සැමියා තිරුකුමාරන් නඩේසන් ඇගේ සැමියා ව්‍යාපාරිකයකු වන අතර හිල්ටන් හොටෙල් සාහාපතිවරයා ලෙසද කටයුතු කළේය.

ජෝර්ජ් රාජපක්ෂ ගේ තවත් දුවෙකි කමලා වික්‍රමසූරිය. කමලා වික්‍රමසූරියගේ දරුවන් (මොවුන්ට මහින්ද සීයාය)
අනෝමා ලෆීර්. වැදගත් චරිතයකි. ඇය දරණ තනතුර ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් ය. එහෙත් ඇය ජනාධිපතිවරයාගේ රහස්‍ය ලේකම්වරිය ලෙස රහසිගත කටයුතු වල යෙදෙන්නියකි. ඇගේ ප්‍රධානම කාර්ය වන්නේ සෑම උදෑසනකම වෙබ් අඩවිවල පලවන පුවත් නිරීක්ෂණය කිරීම සහ ඇයගේ තීරණ මත වෙබ් අඩවි තහනම් කිරීම හා අවහිර කිරීමයි. මේ රටේ පුද්ගලයන් 687 දෙනෙකුගේ දුරකතන සංවාද වලට දිනපතා හොරෙන් සවන් දෙන බව හෙළිවී තිබේ. එමෙන්ම ජනාධිපතිවරයාගේ යුරෝපීය බැංකු ගිණුම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේද ඇයයි. ශ්‍රී ලංකා ටෙලිකොම් හා මොබිටෙල් ආයතනවල අධ්‍යක්ෂකවරියකි.

ජාලිය වික්‍රමසූරිය (උපත 1960) ඇමරිකා එක්සත් ජනපදය සඳහා ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් ලෙස කටයුතු කළ අතර පසුව කැනඩාවේ මහ කොමසාරිධුරයට නම් කරන ලද නමුදු ඔහු දූෂිතයකු බවින් එරට ඔහුව ප්‍රතික්ෂේප කරන ලදී.

එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් මිලදී ගැනීමේදී වික්‍රමසූරිය ඇමරිකානු ඩොලර් 350.000 ක වංචාවක් සිදු කර තිබේ. මෙම ගොඩනැගිල්ල වසර 62 ක් පැරණි නිදන කාමර 07 කින් යුතු නිවසකි. මෙම නිවස මිලදී ගෙන ඇත්තේ ඇමරිකානු ඩොලර් 6. 250.000/- කට ය. නමුත් වික්‍රමසූරිය මෙම ගොඩනැගිල්ල මිලදී ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් 6,600,000/- කට කැබිනට් අනුමැතිය ශ්‍රී ලංකා රජයෙන් ලබා ගෙන ඇත.

වික්‍රමසූරිය ගේ තානාපති කාර්යාලයේ සේවය කරන ශ්‍රී ලංකා රජයෙන් වැටුප් ගෙවන නිලධාරීන් මෙන්ම තානාපති කාර්යාලය සතු දේපල ද තමාගේ තේ ව්‍යාපාරයට යොදා ගෙන තිබිණි. මීට අමතරව තවත් දූෂණ චෝදනා රැසක් වන අතර ඔහුට එරෙහිව කිසිදු පරීක්ෂණයක් පැවැත්වූයේ නැත. තානාපතිධුරයක් හොබවන්නට තරම් අධ්‍යාපන සුදුසුකම් හෝ සැපිරුවකු නොවේ.



කර්නල් (විශ්‍රාම) ප්‍රසන්න වික්‍රමසූරිය, ගෝඨාභය සමඟ එකම රෙජිමේන්තුවේ යුධහමුදාවේ සිටියේය. සීමාසහිත ගුවන්තොටුපොල හා ගුවන් සේවා සමාගමෙහි සභාපති

ගුවන් ගමන් සඳහා භාවිතා කළ හැකි පර්යන්තයක් සැකසීමේ ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුව, වික්‍රමසූරියට හිතවත් ලින්ක් ඉන්ජෙනියරින් පෞද්ගලික සමාගම වෙත ආරම්භයේදී 10% ක කොමිස් මුදලක් හා පළමු ගෙවීමේදී තවත් 10% ක මුදලක් මත මෙම කොන්ත්‍රාත්තුව ලබාදී ඇති බවට චෝදනා එල්ලවිය. රු. 158,710,255.40ක කොන්ත්‍රාත්තුවකි. පසුගියදා ශ්‍රීලනීප වෘත්තීය සමිතිය විසින්ම ඔහුව ඉවත්කරන ලෙස ඉල්ල උද්ඝෝෂණයක්ද සිදුකළේය.

දිසානායක පවුල (මහින්දගේ මවගේ පාර්ශ්වය)

නන්දා සමරසිංහ දිසානායක මහින්දගේ පුංචි අම්මා ඇගේ සැමියා විල්බට් වීරතුංග

ඔවුන්ගේ දරුවෝ

උදයංග වීරතුංග රුසියාවේ තානාපති. රුසියානු කාන්තාවක් විවාහ වී රුසියාවේ ජීවත් වේ. අපොස සාමාන්‍ය පෙළ සමත් තානාපතිවරයෙකි. 2006 වසරේ වූ වසර 62ක් පැරණි පාවිච්චියෙන් ඉවත්කරන ලද මිග් 27 යානා හතරක් වටිනාකම මෙන් දෙගුණයක මිළක් ගෙවා මිළදී ගැනීමට හොර සමාගමක් හදා ඒ හරහා මෙම මිලදී ගැනීම සිදු කරනු ලැබීය. එමඟින් ඩොලර් මිලියන 400ක වංචාවක් කරනු ලැබුවේය. ඒ ගෝඨාභයගේ උපදෙස් පරිදිය.

රමණී වීරතුංග සැමියා එච්.බී.ඒ. නයනානන්ද මාර්ග සංවර්ධන අධිකාරිය තංගල්ල,
දයානි වීරතුංග සැමියා ටෝනි පෙරේරා, ව්‍යාපාරික ඇමෙරිකාව. ගයානි වීරතුංග.

වීරතුංග පවුලේ තවත් ඥාතීන් පිරිසකි මේ

නීල් වීරතුංග- සභාපති - රන්මිනිතැන්න
සනත් වීරතුංග- සාමාන්‍යාධිකාරි ලංකා ප්‍රමුඛ බැංකුව
දයා වීරතුංග - ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්
ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග (ඔහුට ඇත්තේ දුර නෑ කමකි)

මහින්දගේ මවගේ පාර්ශ්වය තවත් ඥතීන්

දකුණු පළාත් සභා මන්ත්‍රී කපිල ගාමිණී සමරසිංහ දිසානායක ඔහුගේ සහෝදාරයා වන උපුල් දිසානායක ලෙක් හවුස් ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිළධාරියාවේ. සජින්වාස් ගුණවර්ධන විදේශ සේවය මුලුමනින්ම කරමින් එය විනාශ කරමක් සිටින අතර මිහින් ලංකා ගුවන් සේවයේ සභාපතිව සිටියදී කෝටි 4000 ක පමණ මුදලක් අස්ථාන ගත විය. හේමාල් ගුණසේකර - පලාත් සභා මන්ත්‍රීවරයෙකි. මැරයෙකි.

ශිරන්ති ආර්යාවගේ පවුලේ ඥාතීන් පිරිසක්ද රාජපක්ෂ පවුල් ගහ ශක්තිමත් කරති.

නිශාන්ත වික්‍රමසිංහ. ශිරන්තිගේ සහෝදරයා ශ්‍රී ලංකන් එයාර් සභාපති. ඔහු මේ තනතුරට පත්වන්නට පෙර සුළු තේ දළු වෙළෙන්දෙකි. අපොස සාමාන්‍ය පෙළවත් සමත් නැත.

ශ්‍රී ලංකන් එයාර් වසර ගණනාවක තිස්සේ දිගින් දිගටම පාඩු ලබන ආයතයක් වී ඇත. බිලියන 90 ක පාඩුවක් මේ වන විට ඔහුගේ සභාපතිත්වය යටතේ අත්කරගෙන තිබේ.

නිශාන්ත පාවිච්චිකරන රොලැක්ස් අත් ඔරලොසුවේ වටිනාකම රුපියල් ලක්ෂ 40 යක් වන බව හෙළිවූයේ ඔහුගේ නිවස සොරු බිඳීම හේතුවෙනි. එහිදී එම නිවසේ තිබී එම ඔරලෝසුවත් අමරිකානු ඩොලර් 11500ක් ස්ටර්ලින් පවුම් 10,500ක් හා රුපියල් ලක්ෂ 10ක් සොරකම් කර තිබුණු අතර විදේශ මුදල් මෙතරම් ප්‍රමාණයක් සන්තකයේ තබා ගැනීම නීතිවිරෝධී කටයුත්තක් බවද හෙළිවිය.

Dilshan Wickramasinghe, CEO of Asset Networks (Pvt) Ltd

Srimal Wickramasinghe, Deputy Chief of Mission and Min

Prasanna Wickramasuriya, Chairman of Airport and Aviat

Jaliya Wickramasuriya (born 1960), Ambassador to th

Anoma Laphir, Co-ordinati ary to the Presider

Minister of

Nirupama Rajapak

ඩිල්ෂාන් වික්‍රමසිංහ නිශාන්ත වික්‍රමසිංහ ගේ පුතාය. රාජපක්ෂවරුන්ගේ චීන ගනුදෙනුවල කොමිස් මුදල් එකතුකර ගැනීම සඳහා ප්‍රබාත් නානයක්කාර නම් ව්‍යාපාරිකයා සමඟ ආරම්භ කළ ගේට්වේ ඉන්ඩස්ට්‍රිස් නම් සමාගමේ පාර්ශ්වකරු[illegible]

ඩිල්ෂාන්, ඉහත කී පර්ශ්වකරුවා සමඟ ආරම්භ කළ අනෙක් ව්‍යාප සමාගම්, ඇසෙට් නෙට්වර්ක් පුද්ගලික සමාගම හා ඇසෙට් හෝල්ඩින් පුද්ගලික සමාගම යන සමාගම් දෙක වේ. රාජපක්ෂ පවුලේ අයතා ගනුදෙනු රැසක්ම සිදුවන්නේ මොහුගේ මැදිහත් වීම මතය.
රාජපක්ෂ ආණ්ඩුව බලයට පත් වූ විගස සමස්ථ රාජ්‍ය ආයතන සමූහයම පරිඝණක ගත කිරීම සඳහා ඇරඹූ "රාජ්‍ය ජාල කරන" ව්‍යාපෘතිය ද ඩිල්ෂාන් වික්‍රමසිංහ විසින් සැම්සුංග් නෙට්වර්ක් සමාගම සමග ඒකාබද්ධව ආරම්භ කළ අතර මෙම සමස්ථ ව්‍යාපෘතිය සඳහා රුපියල් බිලියන ගණනක පිරිවැයක් දැරීමට ලංකා ආණ්ඩුවට සිදු විය. නමුත් මෙකී "රාජ්‍ය ජාල කරන" සම්පූර්ණ ව්‍යාපෘතියම අද වන විට සුදු අලියෙකුගේ තත්වයට පත්ව ඇත. මේ සම්බන්ධ අමරිකානු ඩෝලර් මිලියන 16 දූෂණ චෝදනාවක් ද ඇත.

ශ්‍රීමාල් වික්‍රමසිංහ (ශිරන්තිගේ සහෝදරයා) වියානාහි තානාපති
අසන්ත ඩි මෙල් ශිරන්තිගේ ඥාතියකු වන අතර දූෂිත හෙජින් ගනුදෙනුව සිදු කළ තනැත්තා වේ. එවකට ඔහු ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිය. මේ ගනුදෙනුව නිසා රුපියල් බිලියන 23 ක් විනාශ විය.
සංජය සේදර ක්‍රියාකාරී අධ්‍යක්ෂක වරාය අධිකාරිය රාජපක්ෂ පවුලේ ඥාති වේ.

රාජපක්ෂ පවුලේ ඥාතියකුවන ජනාධිපතිවරයාගේ පුද්ගලික ලේකම්වරිය දයා ගාල්ලගේ ගේ ළඟම ඥාතියෙකු වන ගයාන් එදිරිසිංහ ඇමරිකා තානාපති කර්යාලය සඳහා පත්කර ඇත. මෙම පුද්ගලයා පසුගිය වසර 06 තුල විශේෂයෙන්ම සිදු කර ඇත්තේ තානපතිව සිටි ජාලිය සමඟ තේ ව්‍යාපාරය කිරීමයි.

ජනාධිපති සම්බන්ධීකරන ලේකම් තනතුරු හා රාජ්‍ය ආයතනවල ඉහළ තනතුරු දරමින් සිටින රාජපක්ෂ පවුලේ විශාල පිරිසක් අතරින් තවත් කොටසකි මේ,

අනුරුද්ධ රූපසිංහ, සුමිත් විජේසිංහ, එස් එස් යූ ද සිල්වා, අරුණ ගුණරත්න, රාජා එදිරිසූරිය, අජිත් නිවාඩ් කබ්රාල්, නෙළුම් වීරතුංග භාතිය කොලෙන්නෙ ලක්ෂිත වීරසිංහ පාරක්‍රම දිසානායක කුමාරි බාලසූරිය උපාලි විජේසිංහ ගාමිණි සෙනරත්, ඩිල්ෂාන් ගුණසේකර වී. කේ. ඉන්දික, මහින්ද කොලෙන්නෙ, විජය දහනායක, ජගත් දිසානායක...,,

ඩුබායි මැරියට්...
කාගෙද මේ හෝටලේ?

මෙහි දැක්වෙන්නේ දැවැන්ත ඩුබායි මැරියට් හෝටලයයි. රුපියල් කෝටියේ ඒවාම 10000ක් පමණ සුවිශාල ආයෝජනයක් වන මෙහි හිමිකරුවා වශයෙන් දැක්වෙන්නේ නාත්තණ්ඩියේ ලොකුවිතාන නැමැත්තෙකි. එහෙත් ඒ නමට පමණි. මෙහි සැබෑ හිමිකරුවන් වන්නේ රාජපක්ෂ පවුල සහ දරුවන්ය. රාජපක්ෂ පවුල විසින් රටෙන් මංකොල්ලා කා ඇති අතිමහත් ධනයේ ප්‍රමාණය පෙන්වන ජීවමාන සාක්ෂියක් වශයෙන් මේ හෝටලය දැක්විය හැකිය. මෙම පවුල විසින් ඔවුන්ට පමණක් නොව අනාගත පරම්පරා විසිපහකට සරිලන තරම් ධනයක් ඔවුන්ගේ පසුගිය දහඅවුරුදු පාලන කාලය තුළ කොල්ලකා තිබේ. ඔබ ඡන්දය දෙන්නේ මේ මංකොල්ලය මෙසේ තවත් ඉදිරියට ගෙනයන්නට ද? රටේ ණය බර හේතුවෙන් වහල් වැඩ කරන්නට වන පරපුරක් බවට ඔබේ දරුවන් පත්කිරීමට ඔබ කැමති ද?

තීන්දුව අන් කිසිවකු නොව ඔබ විසින්ම ගත යුතුය.

අංක 400. කෝට්ටේ පාර, පිටකෝට්ටේ, පිහිටි සංනිවේදන බලකාය වෙනුවෙන් ඒ. ඩබ්ලිව්. හේමපාල වන මා විසින් මුද්‍රණය කර බෙදා හරින ලදී.

"This and no other is the root from
which a tyrant springs; when he
first appears he is a protector."
- Plato